

# ඡන්දය කල් දැමීමට එරෙහිව පැෆරල් උසාවියට

ගයාත්‍රී ගීගනආරච්චි

**පළාත්** පාලන මැතිවරණය දිගින් දිගටම කල්දැමීමට එරෙහිව අධිකරණය ඉදිරියේ නඩුවක් ගොනු කිරීමට පැෆරල් සංවිධානය තීරණය කර තිබේ.

# ඡන්දය කල්......



මෙහිදී මූලික කරුණු තුනක් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට නියමිත බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා "ලක්බිම" කළ විමසීමකදී පැවසීය.

ඒ අනුව දැනට සීමා නිර්ණ ගැටලු විසඳා ඇති පළාත් පාලන ආයතනවල සභික ප්‍රමාණය කොට්ඨාස ප්‍රමාණය ඉක්මනින් පළාත් පාලන ඇමැතිවරයා විසින් ගැසට් කළ යුතු අතර ඉතිරි සීමා නිර්ණ ගැටලු විසඳා අවසන් කරන දිනය නිශ්චිතව අධිකරණය ඉදිරියේ පවසන ලෙස එමගින් ඉල්ලා සිටීමට නියමිතය.

එමෙන්ම පළාත් පාලන මැතිවරණය පවත්වන කාලවකවානුව අමාත්‍යාංශය විසින් අධිකරණය ඉදිරියේ ප්‍රකාශයටපත් කළ යුතු බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා කීය.

ඊට අමතරව පළාත් පාලන ආයතනවල සීමා නිර්ණ ගැටලු විසඳන අතරේම පළාත් පාලන පනතේ පවතින අඩුපාඩු සකසාගත යුතු බවත්, එසේ නොවුණහොත් ඒ සඳහා නව කාලයක් ගත වන බවත්, රෝහණ මහතා ප්‍රකාශ කළේය.